(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 58.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0067/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලාව ග්‍රාම නිලධාරි වසමේ, තලාව හංදිය, දඹරැල්ල මාර්ගයේ කි.මී. 01 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0303/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2008 සහ 2009 වර්ෂවලදී ඖෂධ මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(ii) එම මුදලින් එකී වර්ෂයන් සඳහා අමාත්‍යාංශය වෙත ලැබුණු සත්‍ය මුදල කොපමණද;

(iii) එක් එක් වර්ෂය සඳහා ඖෂධ මිලදී ගැනීමට පත් කර තිබෙන කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය කාලයේ ඇති වූ ඖෂධ හිඟයට හේතුව ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණවත් නොවීම බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0321/'10

3.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අතීතයේ සිදුවූ සිද්ධීන් සලකා බැලීම සඳහා ප්‍රතිසන්ධාන මණ්ඩලය හෝ කොමිෂන් සභාව පත් කළ දිනය කවරේද;

(ii) ඉහත සඳහන් කොමිෂන් සභාවේ හෝ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) ඉහත සඳහන් කොමිෂන් සභාවේ හෝ මණ්ඩලයේ වාර්තාව බලාපොරොත්තු වන දිනය කවරේද;

(iv) කොමිෂන් සභාව / මණ්ඩලය අද වන විට රැස් වී ඇති වාර ගණන කවරේද;

(v) මෙම කොමිෂන් සභාවේ / මණ්ඩලයේ පවත්වාගෙන යෑම සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) එම වෙන් කරන ලද මුදල් ප්‍රමාණය ඒ සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0698/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දැනට ශ්‍රී ලංකාව තුළ ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ග්‍රාම නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පවතින කොට්ඨාසවල වැඩ බලන ග්‍රාම නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව ඔහුගේ/ඇයගේ මුල් පත්වීම ලබන අවස්ථාවේ ලැබූ මූලික වැටුපෙන් 1/4 ක් බවත්;

(ii) එම පදනම මත වැඩ බැලීමේ දීමනාව ගෙවීම නිසා මීට වසර 10 - 15 ට පෙර පත්වීම් ලැබූ ග්‍රාම නිලධාරීන්ට ලැබෙන එම දීමනාව ඉතා අල්ප මුදලක් බැවින් එවැනි නිලධාරීන්ට මූල්‍යමය අසාධාරණයක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එවැනි නිලධාරීන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා එතුමා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට අදාළව පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0226/'10

5.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවයන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0323/'10

6\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රජය "මතට තිත" වැඩසටහන ඇරඹූ දිනය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ දක්වා වූ පසුගිය වර්ෂ දහයක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) බියර් සහ සැර මත්පැන් පරිභෝජනය වෙන වෙනම කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ලද බියර් සහ සැර මත්පැන් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාව ආනයනය කරන ලද බියර් සහ සැර මත්පැන් ප්‍රමාණය කොපමණද;

(iv) බියර් සහ සැර මත්පැන් ආනයනයේදී සහ දේශීයව නිෂ්පාදනය කිරීමේදී පනවනු ලබන සියලු ආකාර බදුවලින් රජය උපයන ලද මුළු ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාව තුළ නීති විරෝධීව නිපදවනු ඇතැයි ගණන් බලා ඇති මත්පැන් ප්‍රමාණය පසුගිය වර්ෂ තුන තුළදී කොපමණ ප්‍රමාණයක් වීද යන්න වාර්ෂික පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0699/'10

7\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දකුණු පළාතට අයත් ඩිපෝවල 2005 සිට මේ දක්වා විශ්‍රාම ගිය සේවකයින්ට විශ්‍රාමික පාරිතෝෂික මුදල් ගෙවා නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ ගෙවීමට ඇති මුළු පාරිතෝෂික මුදල කොපමණද;

(ii) විශ්‍රාම යාමෙන් පසු එම සේවකයින්ට හිමි පාරිතෝෂික මුදල ගෙවිය යුතු කාල සීමාව කොපමණද:

(iii) 2005 සිට විශ්‍රාම ගිය සේවකයින්ගෙන් මේ වන විට පාරිතෝෂික මුදල් ගෙවා ඇති සේවක සංඛ්‍යාව සහ ගෙවීමට ඇති සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පාරිතෝෂික මුදල් මේ දක්වා ගෙවා නොමැති විශ්‍රාමිකයින් සඳහා එම මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0730/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පතිරණවත්ත මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයේ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් ඇතිරීම සිදුකළ යුතු ඝණකම, පළල සහ දුර ප්‍රමාණය කොපමණද ;

(iv) මේ වන විට කොන්ක්‍රීට් අතුරා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) කොන්ක්‍රීට් අතුරා අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට කොන්ක්‍රීට් ඇතිරීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බවත් මතුපිට ගැටි සහිත සහ සමතල මට්ටමේ නොමැති බවත් සිමෙන්ති ගැලවී ඉවත්ව ගල් මතුව ඇති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන පරිදි එම ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (දහවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 02 වැනි දින ප්‍රගතිය)

*2.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*3.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*4.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ නියෝග,— 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20 අ වැනි වගන්තියේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූලව එකී පනතේ 20 අ වැනි වගන්තිය සමග කියවිය යුතු 31 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 1667/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුහසාධන අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (ලියාපදිංචි කිරීමේ)" නියෝගයෙහි 2(2) වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2010 අප්‍රේල් මස 12 වැනි දින අංක 1649/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*14.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*15.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*17.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*18.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2011) නැමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.